(පහත සඳහන් සභාපතිතුමියගේ පණිවුඩය වාර්ෂික වාර්තාවේ පිටු අංක 13-15 හි ඇති සභාපතිතුමියගේ පණිවුඩයේ පරිවර්තනයක් පමණි.)

## සභාපතිතුමියගේ පණිවුඩය

සමාගමේ දහතුන් වන වාර්ෂික මහා සභා රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඔබ සැම දෙනා සාදරයෙන් පිළිගැනීමටත්, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව හා ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීමටත් ලැබීම මට ඉමහත් සතුටකි.

### ආර්ථිකය (Economy)

2013 වර්ෂයේ 7.2% ක් ව පැවති දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 2014 වර්ෂයේ දී 7.8% ක් (ඇස්තමේන්තුගත) දක්වා වැඩි කර ගැනීමට රටට හැකිවිය. එයට ප්‍රධාන හේතුකාරකය වූයේ 2014 තුන් වන කාර්තුවේ අවසානය දක්වා 12.5% ක්ව පැවති කාර්මික අංශයේ වර්ධනයයි. අහිතකර කාලගුණ තත්වයන් මත කෘෂිකාර්මික අංශය පසුබෑමක් පෙන්නුම් කල අතර සේවා අංශය 6.4% ක වර්ධනයක් වාර්තා කළේය. ශ්‍රී ලංකා මහ බැංකුව වර්ෂය පුරාම ලිහිල් මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් පොලී අනුපාතික පහළ ගිය අතර එකී අනුපාතික වාර්තාගත පහළ මට්ටමක් වාර්තා කළේය. ඒ අනුව, සියළු මුදල් වෙළඳපොල පොලී අනුපාතික ද වර්ෂය පුරා ම පහත වැටුණි. උදාහරණයක් වශයෙන් වර්ෂය ආරම්භයේ දී 8.29% ව පැවති මාස 12 ක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකය 6% දක්වා අඩු විය. එසේ වුවද, පෞද්ගලික අංශයේ ණය ප්‍රමාණාත්මක ලෙස වර්ධනය නොවුණු අතර වර්ෂයේ අවසාන කාර්තු දෙක තුල පමණක් යම් කිසි ප්‍රගතියක් වාර්තා කළේය. එබැවින් මුදල් වෙළෙඳපොල අරමුදල්, කොටස් වෙළෙඳපොල හා රක්ෂණ කටයුතු කෙරෙහි ක්‍රමයෙන් ගලා යාම සිදුවූවද රක්ෂණ වෙළෙඳපොලෙහි ක්‍රියාකාරීත්වය මන්දගාමී වීම නිසා එම ක්ෂේත්‍රයට අත් වූ ප්‍රතිලාභ අඩු මට්ටමක පැවතිණ. තවද ද්‍රවශීලතාව සාමාන්‍ය මට්ටමක පැවතීමත් සමඟ විදේශ විනිමය අනුපාතිකය ස්ථාවර වීම හා ගෝලීය වෙළඳ ද්‍රව්‍ය මිල ගණන් අඩුවීම නිසා, 2014 දෙසැම්බර් අවසානය වන විට, වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය 3.3% ක් දක්වා අඩු වීමට හේතු විය.

### රක්ෂණ කර්මාන්තය (Insurance Industry)

රක්ෂණ කර්මාන්තය තවදුරටත් උදාසීන ස්වභාවයක් පෙන්නුම් කරමින් ජීවිත රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණ අංශ දෙකෙහිම වර්ධන වේගය තනි ඉලක්කමක රැඳුණි. ජීවිත රක්ෂණ අංශයේ වර්ධනය 9% ක් වූ අතර සාමාන්‍ය රක්ෂණ කටයුතු වර්ධනය 4% කට සීමා විය. මේ සඳහා පෞද්ගලික ණය ඉල්ලුම අඩු මට්ටමක පැවතීම තරමක් දුරට බලපා ඇත. විශාල පරිමාණ රක්ෂණ සමාගම්වල වෙළෙඳපොල ආධිපත්‍යයට තර්ජනයක් වෙමින් මධ්‍යම පරිමාණ රක්ෂණ සමාගම් ජීවිත හා සාමාන්‍ය යන අංශ දෙකෙහිම සැලකිය යුතු වර්ධනයක් පෙන්වීය. මෙහිදී විශාල පරිමාණ රක්ෂණ සමාගම්වල වෙළෙඳපොල කොටස ගිලිහී යාමක් පෙන්නුම් කෙරිණි.

### නියාමන ක්‍රියාරාමුව (Regulatory Framework)

ජීවිත රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සමාගම් දෙකක් ලෙස වෙන්කිරීමට ලබාදී තිබූ කාලසීමාව 2015 ආරම්භයත් සමඟ අවසන් විය. HNB ඇෂුවරන්ස් සමාගම ඇතුළුව බහුතරයක් රක්ෂණ සමාගම්, විවිධ අභියෝග වලට මුහුණ දෙමින් අදාළ කාර්යය සාර්ථක ලෙස නිම කොට ඇත. නියාමන රෙගුලාසි වලට අනුව 2015 පෙබරවාරි මැද වන විට මෙම වෙන් කිරීම අනිවාර්යයෙන්ම කළ යුතුව ඇතත් විශාල ප්‍රමාණයේ සමහර රක්ෂණ සමාගම් මෙතෙක් එම කාර්යය නිම කොට නොතිබීම සැලකිල්ලට ගත යුතු කරුණක් බවට පත්ව ඇත. මෙය කාරණා කොට ගෙන රක්ෂණ ක්ෂේත්‍රය තුල ක්‍රියාත්මක වන සමාගම් හට සමානාත්මතාවයකින් යුතුව තරග කිරීමට අවස්ථාව ලබා දීමේ අරමුණ යටපත් වන අතර, අසමාන තරඟයක් ඇතිවීම වැළැක්වීමේ කාර්යය ද අඩපණ වනු ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේද අනුග්‍රහය ඇතිව රක්ෂණ කර්මාන්තය, අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන ක්‍රියාරාමුව (Risk Based Capital Framework) 2016 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනයේ ප්‍රගතියක් අත්කර ගෙන ඇත. සෑම රක්ෂණ සමාගමක් විසින්ම මෙම නීතිමය අවශ්‍යතාව ඒකාකාරීව ක්‍රියාත්මක කරනු ඇතැයි රක්ෂණ කර්මාන්තය අපේක්ෂා කරයි.

**ජීවිත රක්ෂණ කටයුතු හා සාමාන්‍ය රක්ෂණ කටයුතු සමාගම් දෙකක් බවට පත් කිරීම (Segregation of the Business as Life and General)**

2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්ත (සංශෝධිත) පනතට අනුකූලව, සමාගම ඉලක්කගත දිනයට ජීවිත රක්ෂණ කටයුතු හා සාමාන්‍ය රක්ෂණ කටයුතු වශයෙන්, නෛතිකව වෙන් වූ සමාගම් දෙකක් හරහා සිදු කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිම කළේය. මෙම කාර්යය ඉටු කරන ලද්දේ "HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්" (HNB General Insurance Limited) නමින් සමාගමට පූර්ණ අයිතිය පවත්නා පාලිත සමාගමක් ස්ථාපිත කොට, එයට සියළු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු, 2015 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි පවරා දීමෙනි. මෙම කටයුත්ත, කොටස් හිමියන්, ගනුදෙනුකරුවන්, සේවකයින්, නියාමන බලධාරීන් හා අධිකරණය ඇතුළු සියළු පාර්ශවකරුවන්ගේ එකඟත්වය ඇතිව සාර්ථකව කළමණාකරණය කර ගැනීමට හැකිවූ බව සතුටින් සඳහන් කරමි. ඒ අනුව HNB ඇෂුවරන්ස් පීඑල්සී සමාගම තම කටයුතු ජීවිත රක්ෂණ කටයුතු වලට පමණක් සීමා කරනු ඇති අතර අලුතින් නිර්මාණය කරන ලද පාලිත සමාගම විසින් සාමාන්‍ය රක්ෂණ කටයුතු කරගෙන යනු ඇත.

**කාර්යයසාධනය (Performance)**

මෙම වාතාවරණය තුළ කුඩා රක්ෂණ සමාගම්වලට ඔවුන්ගේ කාර්යයසාධනය වැඩිදියුණු කර ගැනීමට වර්ෂය මුලුල්ලේම දැඩි ප්‍රයත්නයක් දැරීමට සිදු විය. HNB ඇෂුවරන්ස් සමාගම 2013 වර්ෂයේදී ආරම්භ කල වර්ධනය අඛණ්ඩව ඉදිරියට ගෙනයමින් 2014 වර්ෂයේදී ද සිය පිරිවැටුමේ 20% ක වර්ධනයක් අත්කරගත් බව සතුටින් ප්‍රකාශ කරමි. ජීවිත රක්ෂණ අංශය 16% කින්ද සාමාන්‍ය රක්ෂණ අංශය 25% කින්ද වර්ධනය වෙමින් සමස්ත වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් දැක්වීම දිරිගන්වන සුළු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ජීවිත හා සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වූ සමාගමෙහි වෙළෙඳපොල කොටස පිළිවෙලින් 5.25% ක් හා 4% ක් වශයෙන් සැලකිය යුතු අන්දමින් වැඩි විය. තවද සමාගමේ ජීවිත රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණ යන අංශ දෙකම රක්ෂණ වෙළෙඳපොල සාමාන්‍ය වර්ධන වේගයන් වූ ජීවිත රක්ෂණ සඳහා 9% ද සාමාන්‍ය රක්ෂණ සඳහා 4% ද අභිභවා යාමට සමත් විය.

මේ ආකාරයට ව්‍යාපාර කටයුතු වල ධාරිතාව මෙන්ම වෙළෙඳපොල පරාසය වැඩිකරගනිමින්, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ බදු පසු ලාභයේ 7% ක වර්ධනයක් වාර්තා කිරීමට HNB ඇෂුවරන්ස් සමාගම සමත් විය. එමගින් සමාගමේ කොටස් හිමියන්ට ඉහල ප්‍රතිලාභ අත්කර දීමේ විශිෂ්ට ක්‍රියාදාමයද අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි වී ඇත. මෙය වඩාත් ප්‍රශංසනීය වන්නේ 2014 වර්ෂය සමාගමේ බදු පසු ලාභය අඛණ්ඩව වර්ධනය වූ දසවෙනි වර්ෂය බවට පත්වීම හේතුවෙනි.

**ලාභාංශය (Dividend)**

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රථම හා අවසාන ලාභාංශ ලෙස කොටසකට රු.3.75 ක් ප්‍රදානය කිරීමට යෝජනා කර ඇත. මෙහිදී බදු පසු ලාභයේ සතුටුදායක වර්ධනය සැලකිල්ලට ගෙන ඇති අතර, මෙය පෙර මූල්‍ය වර්ෂයේ ලබා දුන් ලාභාංශයට සාපේක්ෂව 15% ක වැඩි වීමකි.

**තිරසාරභාවය හා ආයතනික සමාජීය වගකීම (Sustainability and CSR)**

සමාගමේ ආයතනික සමාජීය වගකීම මැනවින් ඉටු කරමින් ජල පහසුකම් නොමැති පාසල් වලට ජලය සැපයීමේ වැඩසටහන යටතේ, තවත් පාසල් හයකට මෙම වර්ෂය තුලදී ජල පහසුකම් ලබා දීම සිදු කෙරිණ. 2008 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය යටතේ මේ දක්වා දිස්ත්‍රික්ක 21 කට අයත් පාසල් 33 ක,

සිසු දරුවන්, ගුරුවරුන් හා දෙමාපියන් විශාල පිරිසකට සහනයක් ලාබාදීමට හැකි වී ඇත. සමාගමේ තවත් නව්‍ය වැඩසටහනක් වන "පාසලෙන් කාර්යාලයට" (S2O) යන වැඩසටහන මගින්, පාසල් අධ්‍යාපනය අවසන් කල සිසුදරුවන් සිය දෙනෙකුට සංකීර්ණ කාර්යාල ජීවිතය තුල සාර්ථකව ඉදිරියට යාමට අවශ්‍ය මූලික නිපුණතා ලබාදීමේ කාර්යය ඉටු කෙරිණ. තවද සමාගම තම සමාජ වගකීම හා තිරසාරභාවය ඇති කරන තවත් විවිධ වූ ක්‍රියාකාරකම් ගණනාවක නිරත විය. මෙතුලින් දෘශ්‍යාබාධිත හා මානසික වර්ධනයේ අඩුලුහුඩුකම් ඇති පිරිස්, වකුගඩු රෝගීන්, ගංවතුර හා නියං හේතුවෙන් අසරණභාවයට පත්වූවන් ඇතුළු අඩු පහසුකම් භුක්ති විඳින සමාජයේ යම් පුද්ගල කොට්ඨාශවලට සහනයක් සැලසීමට හැකි විය.

### ගෞරව සම්මාන (Accolades)

මූල්‍ය වාර්තාකරණය, ආයතනික යහපාලනය, ඩිජිටල් අලෙවිකරණය හා පුද්ගල සංවර්ධනය වැනි විවිධ ක්ෂේත්‍ර යටතේ දේශිය හා විදේශිය ගෞරව සම්මානයන්ට පාත්‍ර වෙමින් සමාගම තවදුරටත් පිළිගැනීමට බඳුන් විය. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (ICASL) විසින් මෙහෙයවන ලද පනස්වන වාර්ෂික වාර්තා සම්මාන ප්‍රදාන උලෙළේදී රක්ෂණ අංශයේ විශිෂ්ඨතම වාර්ෂික වාර්තාව සඳහා වූ රන් සම්මානයද ආයතනික යහ පාලනය පිළිබඳ හෙළිදරව් කිරීම් සඳහා වූ රජත සම්මානයද දිනා ගැනීමට අපට හැකි විය. මෙහි සඳහන් කල යුතුව ඇති තවත් ජයග්‍රහණ කීපයක් වෙයි. ඒ අතර සාෆා (SAFA) විශිෂ්ට වාර්ෂික වාර්තා සඳහා වූ සම්මාන උලෙළ හා සාර්ක් (SAARC) ආයතනික යහපාලන හෙළිදරව් කිරීම් සම්මාන උලෙළ - 2013 හිදී රක්ෂණ ක්ෂේත්‍රය සඳහා වූ දෙවන ස්ථානයත්, ආසියානු පැසිපික් මානව සම්පත් කළමණාකරණ සම්මේලනයේදී ආයතනික සමාජයීය වගකීම් පිළිබඳ මානව සම්පත් පිළිවෙත් සඳහා සම්මානයත්, SLITAD සම්මාන ප්‍රදානෝත්සවයේදී පුද්ගල සංවර්ධනය සඳහා රජත සම්මානයත්, 2014 ජූලි මාසයේදී සිංගප්පූරුවේ පවත්වන ලද සමාජ මාධ්‍ය සහ ඩිජිටල් අලෙවිකරණ විශිෂ්ටත්වය පිළිබඳ පස්වන C.M.O. ආසියානු සම්මාන ප්‍රදාන උලෙළේදී හොඳම ෆේස්බුක් භාවිතය සම්බන්ධයෙන් ඩිජිටල් අලෙවිකරණය සඳහා වූ සම්මානයත් වෙයි.

LMD සඟරාව විසින් තෝරා නම් කරනු ලැබ ඇති ශ්‍රී ලංකාවේ ඉහළම සමාගම් සියය අතර, තමන්ගේ ස්ථානය රැක ගැනීමටද සමාගම සමත් වී ඇත.

### අනාගත දැක්ම (Future Outlook)

සාමාන්‍ය රක්ෂණ කටයුතු තම පාලිත සමාගමට පවරා දෙමින්, 2015 වර්ෂය තුලදී HNB ඇෂුවරන්ස් පීඑල්සී සමාගම ජීවිත රක්ෂණ සේවා සපයන්නෙකු ලෙස කේන්ද්‍ර ගත වනු ඇත. HNB ඇෂුවරන්ස් සමාගම ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ සමාගම් අතර විශාලත්වයෙන් හයවන ස්ථානයට පත් වෙමින් නුදුරු අනාගතයේදී පළමු සමාගම් පහ අතරට පත්වීමේ අරමුණින් තවදුරටත් සිය වර්ධන වේගය තීව්‍රකර ගැනීමේ කාර්යයෙහි යෙදී සිටී. මේ සඳහා අභ්‍යන්තර (Organic) හා බාහිර (Inorganic) වර්ධන ක්‍රමෝපායන් රාශියක එකතුවක් ක්‍රියාවට නංවනු ඇත. විශ්‍රාමිකයන් හා ක්ෂුද්‍ර රක්ෂණ සේවා ලාභීන් වැනි තවත් සේවාවන් ලබා දිය හැකි ජන කොටස් වෙත වැඩි අවධානයක් යොමු කරමින් සමාගමේ සේවා නිපැයුම් විවිධාංගිකරණය කිරීමටද කටයුතු කරනු ඇත.

එමෙන්ම 2015 වර්ෂයේදී තම පාලිත සමාගම වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලව, ලැයිස්තුගත සමාගමක් බවට පත් කිරීමට අදහස් කෙරේ. මෙහිදී සමාගමේ කොටස් හිමිකමින් යම් ප්‍රමාණයක් මුදාහැරීම මගින් ලැයිස්තුගත කිරීමේ කාර්යය සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂිතය.

### කෘතඥතාව පළකිරීම (Acknowledgement)

අලුතින් පිහිටුවන ලද පාලිත සමාගමේ, එනම් HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් පත්වීම සඳහා ප්‍රතාප්කුමාර් ද සිල්වා මහතා 2014 මැයි 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්විය. 2008 මාර්තු 31 දින සිට අධ්‍යක්ෂවරයෙකු වශයෙන් එතුමන් කල අගනා සේවාව වෙනුවෙන් ස්තුතිය පළ කරන අතර නව පාලිත සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් එතුමාගේ අඛණ්ඩ සහාය ලබා ගැනීමටද අපේක්ෂා කරමි.

**පත්වීම් (Appointments)**

අධ්‍යක්ෂකවරුන්ගේ සංඛ්‍යාව 10 ක් වශයෙන් පවත්වාගෙන යමින් අදාල වර්ෂය තුලදී එක් පත්වීමක් සිදු කරන ලදි. 2014 ජුනි 17 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට එක්වූ වෛද්‍ය සිවකුමාර් සෙල්ලයියා මහතා සුහදව පිළිගනිමි. ආයෝජන කළමනාකරණය ඇතුළුව විවිධ ක්ෂේත්‍ර පිළිබඳ එතුමන් තුළ පවත්නා හසළ දැනුම සළකා බලන විට සමාගම ඉහළ ස්ථානයකට ගෙන යාම සඳහා එතුමන් විසින් විශේෂ දායකත්වයක් ලබා දෙනු ඇතැයි මම විශ්වාස කරමි.

**අගය කිරීම (Appreciation)**

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමිය, අධ්‍යක්ෂ ජෙනරාල්තුමිය සහ අනෙකුත් නිලධාරීන් 2014 වර්ෂය තුලදී ලබා දුන් මාර්ගෝපදේශකත්වය හා අඛණ්ඩ සහාය පිළිබඳව ඔවුන්ට ස්තුති කිරීමට කැමැත්තෙමි. කර්මාන්තයේ වැඩි දියුණුව උදෙසා කර්මාන්තය හා බැඳී කටයුතු කරන රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා විසින් ඉටු කරන ලද කාර්යභාරයද අගය කරමි. වර්ෂය මුළුල්ලේම දැක්වූ විශිෂ්ට සහාය, මාර්ගෝපදේශකත්වය හා සාමූහිකත්වය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික භවතුන්ට මාගේ ස්තුතිය පළ කරමි. විශිෂ්ට ප්‍රතිඵල අත්පත් කර ගැනීම සඳහාත් සමාගමේ ආයතනික ප්‍රතිරූපය ගොඩනැගීම සඳහාත් උද්යෝගීමත්ව, කළමණාකාර අධ්‍යක්ෂකවරයාත්, කළමණාකරණ මට්ටමේ නිලධාරීනුත් අන්‍ය කාර්යය මණ්ඩල සාමාජිකයනුත් කටයුතු කොට ඇත. ඔවුනගේ කැපවීම මාගේ ප්‍රසාදයට ලක් වන අතර ඔවුන්ගේ කාර්යභාරය මම මහත්සේ අගය කරමි.

ඉහළ ප්‍රමිතියක් සහිත ආයතනික යහපාලනයක් හා ආචාරධර්ම පද්ධතියක් අනුගමනය කරමින් තිරසාර පදනමක් මත සමාගමේ සියලුම පාර්ශවකරුවන් වෙත වැඩි වටිනාකමක් නිර්මාණය කර දීමට ඔබේ සමාගම සහ අලුතින් ස්ථාපිත කරන ලද පාලිත සමාගම කටයුතු කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම ඔබට සහතික වෙමි.

රාණි ජයමහ

සභාපතිතුමිය

2015 පෙබරවාරි 09

(පහත සදහන් කළමණාකාර අධ්‍යක්‍ෂවරයාගේ විවරණය වාර්ෂික වාර්තාවේ පිටු අංක 17-23 හි ඇති කළමණාකාර අධ්‍යක්‍ෂවරයාගේ විවරණයේ පිටපතක් පමණි)

## කළමණාකාර අධ්‍යක්‍ෂවරයාගේ විවරණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මුල්‍ය වර්ෂයට අදාල සංකලිත වාර්ෂික වාර්තාව (Integrated Annual Report) හා ගිණුම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමට ලැබීම මට මහත් සතුටකි. මෙය අප විසින් ඉදිරි පත් කරන තෙවන ඒකාබද්ධ වාර්තාව වන අතර අපගේ ප්‍රථම සංකලිත වාර්තා දෙක සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වනු ලබන වාර්ෂික වාර්තා සම්මාන ප්‍රදාන උළෙලේ දී රක්ෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ටතම වාර්තාව ලෙස අඛණ්ඩව ගෞරව සම්මාන ලැබුණි. තවද එකී සම්මාන උළෙලේදීම අපගේ 2013 වාර්ෂික වාර්තාවට ඇතුලත්ව තිබුනු ආයතනික යහපාලන කටයුතු පිලිබඳ ඉදිරිපත් කිරීම වෙනුවෙන් සියලුම ලැයිස්තුගත සමාගම් අතරින් දෙවන ස්ථානය හිමිවිය. මෙම වාර්ෂික වාර්තාවෙන්ද අප උත්සහ ගනු ලබන්නේ අපගේ ප්‍රධාන පාර්ශවකාර කණ්ඩායම් සඳහා වටිනාකමක් ඇති අර්ථවත් තොරතුරු සැපයීමේ කාර්යයෙහි තවත් ඉදිරි පියවරක් තැබීමටය.

### කර්මාන්තයේ පසුබිම් වාතාවරණය (Industry Environment)

2014 වර්ෂය තුලදී රක්ෂණ ක්ෂේත්‍රයේ වර්ධන වේගය තව දුරටත් පහළ ගිය අතර වර්ධනය පිලිබඳ ඉදිරි පිම්මක් අත් කර ගත නොහැකි විය. මෙය වඩාත් පිලිබිඹු වනුයේ 2013 දී 9% ව පැවතුණු සාමාන්‍ය රක්ෂණ කටයුතු වල වර්ධනය, මෙම වර්ෂයේදී 4% ක් දක්වා පහල බැසීම තුලිනි. එමෙන්ම 2013 වර්ෂයේ 10% ක් ව පැවති ජීවිත රක්ෂණ වර්ධනය, 2014 වර්ෂය තුළදී 9% ක් දක්වා පහළ බැස ඇත. ඒ අනුව රක්ෂණ වෙළෙඳපොලේ ඒකාබද්ධ වර්ධන අනුපාතිකය 6% ක මට්ටමක පැවතුනි. ජීවිත රක්ෂණ වර්ධන වේගයේ පසුබැමට කුටුම්භ ආදායම් මට්ටම අඩුවීම බලපාන්නට ඇති අතර වාහන ආනයන කටයුතු වල වර්ධනය අඩුවීම හා පෞද්ගලික අංශයේ ණය ප්‍රසාරණය හීනවීම සාමාන්‍ය රක්ෂණ කටයුතුවල පසුබැමට හේතු කාරක වී ඇත. කෙසේ වෙතත් මහා පරිමාණ රක්ෂණ සමාගම්වල වෙළෙඳපොල කොටස අත් පත් කර ගනිමින් ඇතැම් මධ්‍ය පරිමාණ රක්ෂණ සමාගම් සීග්‍ර වර්ධන වේගයක් අත් කර ගැනීම දිරිගන්වන සුලු කාරණයකි.

### කාර්යයසාධන විශ්ලේෂණය (Overview of Performance)

ඉකුත් වර්ෂය සමාගමට බෙහෙවින් වැදගත් කාලපරිච්ඡේදයක් වූයේ සමාගම නෛතිකව ආයතන දෙකක් බවට වෙන් කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිම කිරීමට හැකිවීම හේතුකොටගෙනය. එසේම 2016 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වීමට නියමිත අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධන කාර්ය සැලැස්ම (Risk Based Capital Framework) ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම් වීමට අපට සිදුවිය. ඉකුත් වර්ෂයේ සමාලෝචනයේ දී මම පහත සඳහන් පරිදි ප්‍රතිඥාවක් ලබා දුනිමි. එනම්“ ඉහත සඳහන් කළ කාරණා සම්බන්ධයෙන් කළමණාකාරීත්වයට සැලකිය යුතු කාලයක් වෙන් කිරීමට සිදුවන අතර, ඉකුත් වර්ෂයේ අත් පත් කර ගත් ඉහල වර්ධන වේග ප්‍රවණතාව අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සමස්ත කාර්යමණ්ඩලයේ හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහයෝගය ද ඇතිව කළමනාකරණ කණ්ඩායම කැපවීමෙන් කටයුතු කරනු ඇත.”යනුවෙනි. උදාසීන වෙළෙඳපොල තත්ත්වයන් මධ්‍යයේ වුවද, ඉහත සඳහන් ප්‍රතිඥාව සාර්ථකව ඉටු කිරීමට අපට හැකිවීම ගැන මම ආඩම්බර වෙමි.

2014 පිරිවැටුම 20% කින් වර්ධනය කර ගැනීමට සමාගමට හැකිවූ අතර එය 2013 දී සමාගම අත් කර ගත් 21% ක වර්ධන වේගය හා සසඳන කල, සුළු අඩුවීමකි. මෙකී කාර්යයසාධනයේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ, ජීවිත රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණ යන දෙඅංශයෙන්ම සැලකිය යුතු දායකත්වයක් ලැබීමයි.

සාමාන්‍ය රක්ෂණ කටයුතුවල වර්ධනය 25% ක් ලෙස සැලකිය යුතු සේ වැඩි වූ අතර ජීවිත රක්ෂණ කටයුතුවල වර්ධන වේගය 16% ක් වීය. දෙඅංශයෙන්ම ලද මුළු පිරිවැටුම රුපියල් බිලියන 2.3 ඉක්ම වූ අතර ජීවිත රක්ෂණ කටයුතුවලින් ලද පිරිවැටුම සාමාන්‍ය රක්ෂණ කටයුතුවල පිරිවැටුමට වඩා සුළු වශයෙන් ඉහළ මට්ටමක පැවතුනි.

වෙළෙඳපොල වර්ධන අනුපාතික හා සසඳා බැලීමේ දී සමාගමේ වර්ධන අනුපාතික ඉහළ මට්ටමක පැවතීම මත තම වෙළෙඳපොල කොටස ඉහළ නංවා ගැනීමට දෙඅංශයටම හැකි වී තිබේ. ජීවිත රක්ෂණ අංශයේ

වෙළෙඳපොල කොටස 4.9% සිට 5.3% දක්වා වර්ධනය වීමත් සමඟ වෙළෙඳපොලේ ස්ථානගත මට්ටම ද හත්වන ස්ථානයේ සිට හයවන ස්ථානය දක්වා ඉහළට ගමන් කොට ඇත. ඒ ආකාරයටම සාමාන්‍ය රක්ෂණ අංශයේ වෙළෙඳපොල කොටස 3.3% සිට 4.00% දක්වා වැඩි වී ඇති අතර කලින් අටවැනි ස්ථානයේ පසු වූ සාමාන්‍ය රක්ෂණ අංශය එම ස්ථානය තවදුරටත් පවත්වාගෙන යාමට සමත් විය.

පිරිවැටුමේ ධාරිතාව සැලකිය යුතු ලෙස වැඩි කලද, ලාභදායිතාව කෙරෙහි පැවති අවධානය අඩු නොකළ බව මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ යුතුව ඇත. සමාගම ප්‍රථමවරට රුපියල් මිලියන 400 ක කඩඉම පසු කරමින්, සමාගමේ බදු පසු ලාභය 7% කින් වර්ධනය කර ගැනීමට සමත් වීම ප්‍රශංසනීය වන අතර 2004 සිට අඛණ්ඩව වර්ෂ 10 ක් පුරා ලාභයේ වර්ධනයක් අත්පත් කර ගැනීමට හැකිවීම සුවිශේෂී කාරණයක් වන්නේය. මෙය කවර ක්ෂේත්‍රයක වුවත් සමාගම් අතළොස්සකට පමණක් සම කළ හැකි වාර්තාවකි. බදු පසු ලාභය වර්ධනය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාගමේ කොටසක ඉපයීම (Earnings Per Share) රු.8.35 දක්වා වර්ධනය වූ අතර, සාමාන්‍ය කොටස් මත ප්‍රතිලාභය (Return on Equity) 17% ක් බවට පත් විය.

## සාමාන්‍ය රක්ෂණ අංශය (General Insurance Sector)

සාමාන්‍ය රක්ෂණ කටයුතුවල වර්ධනය සඳහා සියලුම ව්‍යාපාර අංශ දායක වී තිබේ. කුඩා පදනමක් මත වුවද මුහුදු රක්ෂණය (Marine Insurance) හා අදාල ව්‍යාපාර කටයුතු 45% ක වර්ධනයක් වාර්තා කිරීම සුවිශේෂී වේ. මෝටර් රථ රක්ෂණය අත් කර ගත් 30% ක වර්ධනය, සමස්ත සාමාන්‍ය රක්ෂණ කටයුතු වල වර්ධනයට පුරෝගාමී බලවේගයක් වෙමින් පිරිවැටුමට 72% ක දායකත්වයක් ලබා දුන්නේය. සමස්ත පිරිවටුමෙන් 15% කට දායක වූ ගිනි හා ඉංජිනේරු රක්ෂණය ඊලඟ වැඩිම දායකත්වයක් ලබා දුන් අංශ වෙයි. එනමුත් තියුණු මිල තරඟය හේතුවෙන් එම අංශයේ වර්ධනය 8% කට පමණක් සීමා විය.

ව්‍යාපාර වර්ධනයේ තියුණු නැග්ම මත හානි පූර්ණ වන්දි වලද වැඩි වීමක් සිදු විය. ඉකුත් දෙවර්ෂය තුළ දක්නට ලැබුණු ශුද්ධ හානි පූර්ණ වන්දි අනුපාතය (Net Claims Ratio) අඩුවීමේ ප්‍රවණතාව ආපසු හරවමින් මෙම වර්ෂය තුළ දී එය 66% සිට 72% දක්වා ඉහළ ගියේය. ඉහළ ගිය හානි පූර්ණ වන්දි වල බලපෑම යම් දුරකට සමනය කර ගැනීම සඳහා 39% සිට 38% දක්වා වියදම් අනුපාතය (Expense Ratio) අඩුවීම උපකාරී විය. එහෙත් සංයුක්ත අනුපාතය (Combined Ratio) 105% සිට 110% දක්වා වැඩිවීම මිල ගණන් පිළිබඳ දක්වන විචක්ෂණශීලී ප්‍රතිපත්ති වල දුර්වලතාවයක් පෙන්නුම් කරන හෙයින්, ඒ ගැන විශේෂයෙන් සැලකිලිමත් වීමට සිදුව ඇත. මේ සම්බන්ධයෙන් මිල ගණන් ඉහළ නැංවීම හා ලාභ නොලබන ආයතනික ගිණුම් අලුත් නොකිරීම වැනි යම් යම් ක්‍රියාමාර්ග ගැනීම මගින් 2015 වර්ෂය තුළ දී මෙම තත්ත්වය යහපත් අතට පරිවර්තනය කිරීමට බලාපොරොත්තු වෙමි. එසේ නොවුනහොත් එම තත්ත්වය පාලනය කොට එම අනුපාතය පිළිගත හැකි මට්ටමකට ගෙන ඒම සඳහා වෙනත් යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීමට HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගමේ කළමනාකරණ කණ්ඩායම පසුබට නොවනු ඇත.

එසේ වුවද, ආයෝජන ආදායමේ 21% ක් වන සැලකිය යුතු වර්ධනය උපයෝගී කර ගෙන, බදු පෙර ලාභය වශයෙන් රුපියල් මිලියන 211 ක් වාර්තා කිරීමට සාමාන්‍ය රක්ෂණ අංශය සමත් වූ අතර එය සමාගමේ සමස්ත ලාභයට අනගි දායකත්වයක් සැපයීය.

## ජීවිත රක්ෂණ අංශය (Life Insurance Sector)

සමාලෝචිත වර්ෂය තුළ දී, ජීවිත රක්ෂණ අංශය 16% ක සතුටුදායක වර්ධනයක් වාර්තා කළේය. 2013 දී ලත් 34% ක වර්ධනය හා සසඳා බැලීමේදී අඩුවීමක් පෙන්නුම් කළද, කාරණා 2 ක් මත එය සැබවින්ම ප්‍රශංසනීය කාර්යයසාධනයක් බව ප්‍රකාශ කල හැක. ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතු ඉහළ නංවා ගැනීම සඳහා කෙටිකාලීන තනි වාරික ආයෝජන ඔප්පු (Short Term Single Investment Policies) මත යැපීම අඩු කර ගැනීමට හැකි වීම පළමුවන කාරණය වෙයි. එවැනි ඔප්පු වලින් ලත් ආදායම 11% කින් අඩු වී තිබීමෙන් එය පැහැදිලි වෙයි. දෙවන කාරණය වන්නේ දීර්ඝ කාලයක් සඳහා වන පරිත්‍යාග ජීවිත රක්ෂණ ඔප්පු (Endowment Policies) විකිණීමේදී ප්‍රථම වාරික (First Premium) මගින් ලද පිරිවැටුම 43% කින් වර්ධනය වීම සමස්ත අංශයේම වර්ධනයේ පුරෝගාමී බලවේගයක් බවට පත් වීමයි.

පරිත්‍යාග ජීවිත රක්ෂණ ඔප්පු(Endowment Policies) වල වර්ධනයට නව ව්‍යාපාර කටයුතුවල (New Business) වර්ධනයෙන් ලද දායකත්වය අඩු මට්ටමක පැවතීම පසුගිය වර්ෂවල අවධානයට ලක් වූ කාරණයක් බැවින් මෙම වර්ෂයේදී ඇති කරගත් වර්ධනය සැබවින්ම දිරිගන්වන සුළුය. පරිත්‍යාග ජීවිත රක්ෂණ ඔප්පු(Endowment Policies) යටතේ කෙරෙන ව්‍යාපාර කටයුතුවලින්, දීර්ඝ කාලයක් මුළුල්ලේ ලාභ ජනනය කළ හැකි බැවින්, මෙය නිෂ්පාදන මිශ්‍රය කෙරෙහි යහපත් බලපෑම් ඇති කරන්නක් වනු ඇත. නිවාස ණය වෙළෙඳපොල කටයුතු වර්ධනය වීම හේතුවෙන් උකස් සුරකුම් රක්ෂණ ඔප්පු (Mortgage Reducing Policies) පිරිවැටුම ද 32% කින් වර්ධනය වී ඇත.

වර්ෂ අවසානයේ සිදු කරන ලද දිගු කාලීන ව්‍යාපාර තක්සේරුවේදී, සමාගම සතු දිගු කාලීන රක්ෂණ අරමුදල අවශ්‍ය තක්සේරුගත සංචිත (Actuarial Reserves) මුදලට වඩා රුපියල් මිලියන 761 ක අතිරික්තයක් වාර්තා කෙරුනි. මෙම අතිරික්තයෙන් රුපියල් මිලියන 252 ක් නුබුන්වත්කම් ආන්තිකය (Solvency Margin) රඳවා ගැනීම වෙනුවෙන්ද තවත් රුපියල් මිලියන 172 ක් අනාගත ප්‍රසාද දීමනා සහ අනපේක්ෂිත වියදම් (Bonus and Contingencies) සඳහා ද වෙන් කරන ලදී. තවද අතිරික්ත ශේෂයෙන් රුපියල් මිලියන 109 ක් ඔප්පු හිමියන් වෙත ප්‍රසාද දීමනා වශයෙන් ලබා දුන් අතර රුපියල් මිලියන 228 ක් ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් ලද අතිරික්තය වශයෙන් කොටස් හිමියන්ගේ ගිණුමට මාරු කරන ලදී. ලාභය සඳහා සහභාගී වන රක්ෂණ ඔප්පු (Policies with participating profit) වෙනුවෙන් සෑම රුපියල් 1000 ක රක්ෂිත අගයක් සඳහා රුපියල් 65 ක් දක්වා වූ අනුපාතයකට ප්‍රසාද දීමනාවක් ප්‍රකාශයට පත් කිරීමට අමතරව ලාභාංශ මත පදනම් වූ ඔප්පු හිමියන් හට 8% ක ලාභාංශයක් ද ප්‍රකාශයට පත් කරන ලදී. වර්තමාන වෙළෙඳපොල තත්වයන් යටතේ වුවද ඔප්පු හිමියන්ට මෙලෙස ආකර්ශනීය ප්‍රතිලාභ පිරිනැමීම සඳහා රුපියල් මිලියන 15.3 ක්ද වෙන් කරන ලදී.

කොටස් හිමියන් වෙත පවරන ලද අතිරික්තය පෙර වසරට සාපේක්ෂව 26% ක වර්ධනයක් වාර්තා කළ අතර අදාළ අතිරික්තය මාරු කිරීමෙන් පසුවද ජීවිත රක්ෂණ අරමුදල 28% කින් වර්ධනය කරගනිමින් රුපියල් බිලියන 5.6 ක අගයක් වාර්තා කිරීමට හැකි විය.

## <u>ආයෝජන (Investments)</u>

තම ආයෝජන මනාව කළමනාකරණය කිරීමෙන් සැලකිය යුතු දායකත්වයක් අත්කර ගැනීමට මෙම වර්ෂය තුලදීද සමාගම සමත් වී ඇත. ජීවිත රක්ෂණ ආයෝජන ආදායම 22% කින් වර්ධනය වූ අතර සාමාන්‍ය රක්ෂණ ආයෝජන ආදායම 19% කින් වර්ධනය විය. දෙඅංශයෙන්ම ලත් ඒකාබද්ධ ආයෝජන ආදායම ප්‍රථම වතාවට රුපියල් බිලියන 1 ක කඩඉම පසුකිරීම වැදගත් සංසිද්ධියක් විය. පොලී අනුපාතික තියුණු අන්දමින් අඩුවී තිබුණු අභියෝගකාරී ආයෝජන වාතාවරණයක් මධ්‍යයේ, ආයෝජන ආදායම මෙවැනි වර්ධනයක් අත්කර ගැනීමට හැකිවීම ප්‍රශංසාවට ලක්විය යුතුය.

පොලී අනුපාතික අවපාතයට ලක්වන වන විට ද්විතීයික වෙළඳපොලේ පැවති අවස්ථාවන්ගෙන් වාසිසහගත තත්ත්වයක් ලබාගැනීමේ අරමුණ ඇතිව, භාණ්ඩාගාර බැඳුම්කර හා ණයකර ගනුදෙනු කිරීම සඳහා සක්‍රියව සහභාගී වීම කෙරෙහි සමාගම සිය අවධානය යොමු කළේය. භාණ්ඩාගාර බැඳුම්කර ගනුදෙනුවලින් රුපියල් මිලියන 69.7 ක් ද ණයකර ගනුදෙනුවලින් රුපියල් මිලියන 26.2ක් ද ප්‍රාග්ධන ලාභ උපයා ගැනීමට සමාගමට හැකිවිය. මෙය පොලී ආදායමේ අඩුවීමෙන් සමාගමට වන පාඩුව පිරිමැසීමට හේතු විය. කොටස් වෙළෙඳපොලේ ඇති වූ වර්ධනය ප්‍රයෝජනයට ගනිමින් සාමාන්‍ය කොටස් ගනුදෙනුවලින් රුපියල් මිලියන 12.2 ක උපලබ්ධි ලාභයක් (Realised Gains) ද සාධාරණ අගය මගින් ලාභ අලාභ වන ලෙස නම් කල කොටස් වෙළෙඳපොල ආයෝජන (Fair Value through Profit and loss) වලින් රුපියල් මිලියන 98.9 ක උපලබ්ධි නොවූ ලාභයක්(Unrealised Gains) ද ලබා ගැනීමට සමාගමට හැකි විය. විදේශ විනිමය අනුපාතික සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස විදේශ ව්‍යවහාර මුදලින් කළ තැන්පතු සඳහා සැලකිය යුතු විදේශ විනිමය ලාභ උපදවා ගැනීමට නොහැකි විය.

**සමාගමේ ව්‍යාපාර කටයුතු ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ලෙස වෙන් කිරීම (Segregation of the Business as Life and General)**

“HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්” නමින් සිය පූර්ණ අයිතියෙහි පසුවන පාලිත සමාගමක් පිහිටුවීමත් එම පාලිත සමාගම 2015 ජනවාරි 1 දින සිට සිය ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමත් සමග ජීවිත හා සාමාන්‍ය රක්ෂණ කටයුතු ස්වාධීන ව්‍යාපාර දෙකක් බවට පත් කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිම කිරීමට සමාගමට හැකි විය. කල් ඇතිව කොටස් හිමියන්ගේ සහ ඔප්පු හිමියන්ගේ අනුමැතිය ලබාගෙන, නියාමන ආයතනය සමග එකඟ වූ ක්‍රියාපිළිවෙල නිසි පරිදි අනුගමනය කිරීමට සමාගම කටයුතු කළේය. නව සමාගමට ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය වන බලපත්‍රය ලබාගැනීම සඳහා වන අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීම ද නියමිත දිනට පෙර සිදුකෙරිණ. සාමාන්‍ය රක්ෂණ සේවා සපයන්නෙකු වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි වීමෙන් අනතුරුව වර්ෂ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතේ 102 වන වගන්තියට අනුකූලව සමාගමේ පවත්නා සාමාන්‍ය රක්ෂණ කටයුතු නව සමාගමට පැවරීම සඳහා දිස්ත්‍රික් උසාවියේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදී. උසාවියේ අනුමැතිය ලැබීමෙන් පසුව 2015 ජනවාරි 01 දින සිට වලංගු වන පරිදි අදාල ව්‍යාපාරික කටයුතු හා ඊට අදාල වත්කම් හා බැරකම් සියල්ලක්ම සමාගම විසින් නව සමාගමට පවරා දෙන ලදී.

ඉහත සඳහන් නෛතික ක්‍රියාමාර්ග ගන්නා අතරම , අවශ්‍ය වන අභ්‍යන්තර සංවිධාන ව්‍යුහයේ වෙනස්කම් ක්‍රම ක්‍රමයෙන් සිදු කිරීම මගින් මෙම සංක්‍රාන්තිය බාධා රහිතව සිදු කෙරිණි. කලින් පැවති ඒකාබද්ධ අලෙවිකරණ හා බෙදාහැරීමේ අංශය අහෝසි කොට, 2014 මාර්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එකී සියලූ කාර්යයන් වෙන් කොට ජීවිත රක්ෂණ අංශයේ හා සාමාන්‍ය රක්ෂණ අංශයේ සාමාන්‍යාධිකාරීන් වෙත පවරන ලදී. 2014 ඔක්තෝබර් 01 දින සිට වලංගු වන පරිදි සහායක සේවාවන් ද බෙදා වෙන් කෙරිණ. ඉහල වැදගත්කමක් ඇති සමහර පොදුවේ පරිහරනය වන සේවාවන් මව් සමාගම යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරිණි. සාමාන්‍යාධිකාරීන් දෙදෙනා 2015 ජනවාරි 01 දින ක්‍රියාත්මක වන පරිදි සමාගම් දෙකෙහි ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන් (Chief Operating Officers) වශයෙන් උසස් කරනු ලැබූහ. තවද ඔවුන් දෙදෙනාට සමාගම් දෙකෙහි මූලික නිලධාරියාගේ (Principal Officer) හා විශේෂිත නිලධාරියාගේ (Specified Officer) නියාමන වගකීම් සියල්ලක්ම පවරනු ලැබිණ.

**ප්‍රාග්ධනය හා නුබුන්වත්කම (Capital and Solvency)**

අමතර ප්‍රාග්ධනයක් ලබාගැනීමෙන් තොරව, අදාල ව්‍යාපාර කටයුතු සමාගම් දෙකකට බෙදා වෙන් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය ප්‍රාග්ධන සම්පාදනය කර ගැනීමට සමාගමට හැකිවිය. බලපත්‍රයක් ලබාගැනීමට ඉල්ලුම් කිරීමට පෙරාතුවම HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගමට රුපියල් මිලියන 100 ක මූලික ආයෝජනයක් කරන ලදී. ඉන් අනතුරුව 2015 ජනවාරි 01 දින තවත් රුපියල් මිලියන 900 ක් ආයෝජනය කරමින් නව සමාගමේ ප්‍රාග්ධනය රුපියල් බිලියන 1 ක් බවට පත් කරන ලදී. මෙය අවම ප්‍රාග්ධන අවශ්‍යතාව (Minimum Statutory Requirement) වන රුපියල් මිලියන 500 ට වඩා බෙහෙවින් ඉක්මවා ගිය ප්‍රමාණයකි. HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගමේ නුබුන්වත්කම් (Solvency) හා අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධන (Risk Based Capital Framework) අවශ්‍යතා සඳහා මෙකී ප්‍රාග්ධනය මැනෙවින් ප්‍රමාණවත් වේ. ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතු සඳහා මව් සමාගම සතුව රුපියල් බිලියන 1.4ක පමණ ප්‍රාග්ධනයක් හා සංචිත රඳවා ගෙන ඇත. මෙම ප්‍රාග්ධන මුදල ජීවිත රක්ෂණ සමාගමේ නුබුන්වත් හා අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් වේ.

මෙකී ප්‍රාග්ධනයේ ප්‍රමාණාත්මක බව තහවුරු කර ගනිමින් සමාගමේ රක්ෂණ කරුවන්ගේ මූල්‍ය ශක්තිය පිළිබඳ ශ්‍රේණි ගත කිරීම (Insurer Financial Strength Rating) සහ ජාතික දිගු කාලීන ශ්‍රේණි ගත කිරීම (National Long Term Rating), ෆිච් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් (Fitch Ratings Lanka Ltd) වෙතින් ‘A(lka) ’ ලෙසින් ප්‍රකාශයට පත් කෙරිණි. එකී ශ්‍රේණිගත කිරීම් අනුව 2015 ජනවාරි වන විට සමාගම ස්ථාවර මට්ටමක පවත්නා බවට තහවුරු කර ඇත. අලුතින් පිහිටුන ලද HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගම වෙත ද එලෙසම ‘A(lka) ’ශ්‍රේණිගත කිරීම් ලැබීමත් සමග ෆිච් ශ්‍රේණි ගත කිරීම් ලද ප්‍රථම විභේදනය කළ සමාගම් යුගලය බවට පත්වීමට අපට හැකි විය.

## යහපාලනය (Governance)

අදාල වර්ෂය තුලදී යහපාලනය පිලිබදව ඉහලම ප්‍රමිතීන්ට අනුකූලව ව්‍යාපාර කටයුතු කරගෙන ගිය රක්ෂණ ආයතනයක් වශයෙන් අප සතුව පැවති කීර්තිනාමය එසේම රැක ගැනීමට සමාගම කටයුතු කර ඇත. ඉහත සදහන්ව ඇති පරිදි සමාගම වෙන් කිරීමේ ක්‍රියාදාමය අදාල සියලුම පාර්ශවකරුවන්ගේ එකඟත්වය ඇතිව කරගෙන ගිය ආකාරය බෙහෙවින් ආදර්ශනීය විය. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (ICASL) විසින් පවත්වන ලද පනස්වන වාර්ෂික වාර්තා ත්‍යාග ප්‍රදානෝත්සවයේදී සමාගමේ ආයතනික යහපාලන කටයුතු පිලිබද ඉදිරිපත් කිරීම වෙනුවෙන් රිදී සම්මානයක් දිනා ගැනීමටද අපට හැකිවිය.

ප්‍රතාප්කුමාර් ද සිල්වා මහතා මෙම සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් වර්ෂ හයක් සේවය කොට, අලුතින් පිහිටුවන ලද සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට එක්වීම සඳහා 2014 මැයි 21 දින ඉල්ලා අස් විය. එතුමාගේ දීර්ඝකාලීන සේවාකාලය තුලදී දැක්වූ සහය හා මාර්ගෝපදේශ සැපයීමෙන් කරන ලද විශිෂ්ට කාර්යභාරය සම්බන්ධයෙන් මෙහිදී කෘතඥතාව පළ කරන අතර පාලිත සමාගම තුළ ඔහුගේ නව කාර්යභාරය හරහාද එම සහය අපේක්ෂා කරමි. ප්‍රතාප්කුමාර් ද සිල්වා මහතා ඉල්ලා අස්වීමෙන් පුරප්පාඩු වූ අධ්‍යක්ෂකධූරයට 2014 ජූනි 17 දින වෛද්‍ය සිවකුමාර් සෙල්ලයියා මහතා පත්විය. එතුමා සාදරයෙන් පිළිගන්නා අතර සමාගමේ වැඩිදියුණුව උදෙසා, විශිෂ්ට දායකත්වයක් සපයනු ඇතැයි අපේක්ෂා කරමි.

නව රෙගුලාසි අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කිරීම ආරම්භ වීමට ප්‍රථම ස්වේච්ඡාවෙන් ක්‍රියාත්මක කරමින් සමාගමේ යහපාලන කාර්යසැලැස්ම තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා සහසම්බන්ධ පාර්ශවයන් (Related Party) සමහ කෙරෙන ගනුදෙනු සමාලෝචනය කිරීමේ අරමුණින් විමර්ශන කමිටුවක් (Related Party Transactions Review Committee) පිහිටුවන ලදී. එහි සභාපතිවරයා සරත් රත්වත්තේ මහතා වන අතර මහේන්ද්‍ර ජයසේකර මහතා සහ මම එහි අනිකුත් සාමාජිකයෝ වෙමු. සමාගම හා සහසම්බන්ධයක් දක්වන පාර්ශවයන් සමග සමාගම කරන ගනුදෙනු ගැන අධීක්ෂණය කිරීම කමිටුවේ කාර්යභාරය වෙයි.

ආයෝජන කමිටුව වඩාත් ශක්තිමත් කිරීම සඳහා 2014 වර්ෂය අවසානයේදී වෛද්‍ය සිවකුමාර් සෙල්ලයියා මහතා එහි සාමාජිකයෙකු වශයෙන් පත් කරන ලදී.

## අගය කිරීම (Appreciation)

සමාගමේ සභාපතිනිය ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළු සාමාජිකයන් අප හට නිරන්තරයෙන් ලබා දුන් මහ පෙන්වීම හා දිරි ගැන්වීම මම ඉතා අවංකව අගය කරමි. නව ආයතනික ව්‍යුහයකට පරිවර්තනය වීම කළමනාකරණය කරන අතරතුර රක්ෂණ සමාගමක් වශයෙන් විශිෂ්ට ප්‍රතිඵලයක් අත්කර ගැනීම සඳහා කැපවී කටයුතු කළ ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන්, අංශභාර ප්‍රධානීන්, කළමනාකරුවන් , කාර්යමණ්ඩල සාමාජිකයන්, ක්ෂේත්‍ර නිලධාරීන් සහ රක්ෂණ උපදේශකයන් ඇතුළු සමස්ත කණ්ඩායම මෙහිදී මාගේ ප්‍රශංසාවට ලක් වන අතර අපගේ සියලුම රක්ෂණ තැරැව්කරුවන්, කළමනාකරුවන් ඇතුළු හැටන් නැෂනල් බැංකු ශාඛාවල කාර්යමණ්ඩල සාමාජිකයන්, වෙනත් මැදිහත්කරුවන්, ප්‍රාරක්ෂකයන්, ප්‍රාරක්ෂන තැරැව්කරුවන් සහ වෙනත් ක්‍රමෝපායික සහකරුවන් දැක්වූ විශිෂ්ට සහය සහ ඔවුන්ගේ විශ්වාසවන්තභාවය කෙරෙහි මගේ කණ්ඩායමේ සහ මාගේ ස්තුතිය පල කරනු කැමැත්තෙමි.

## ක්‍රමෝපායික යොමුවීම සහ අනාගත ගමන් මග (Strategic Focus and Future Direction)

වර්ෂ 13 කට අධික කාලයක් ඒකාබද්ධ රක්ෂණ සමාගමක් වශයෙන් අපගේ සියලුම පාර්ශවකරුවන් වෙත නිරතුරුව වටිනාකමක් ලබා දුන් HNB ඇෂුවරන්ස් සමාගම, ජීවිත රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණ සමාගම් දෙකක් වශයෙන් වෙන්වී අදාළ ව්‍යාපාර කටයුතු කරන, නව ව්‍යුහයක් සහිත සමූහ ආයතනයක් ලෙසින් අපගේ පාර්ශ්වකරුවන් සඳහා වැඩි අගයක් නිර්මාණය කිරීම සඳහා 2015 වර්ෂයේ සිට නව ගමනක් ආරම්භ කරයි.

ඔබේ සමාගම ජීවිත රක්ෂණ ක්ෂේත්‍රය තුළ පමණක් කටයුතු කරන අතර, මෙම සමාගමට පූර්ණ අයිතියක් පවත්නා නව පාලිත සමාගම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු ගැන පමණක් අවධානය යොමු කරනු ඇත.

රටේ ජීවිත රක්ෂණ සේවා සපයන හයවන විශාලතම රක්ෂණ සමාගම වශයෙන්, ඉකුත් වර්ෂ කීපය තුළ අත් පත් කර ගත් ඉහළ වර්ධන වේගය තවදුරටත් පවත්වා ගනිමින්, රක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළම සමාගම් පහ ඇතුළත් 'ප්‍රධාන ආයතන සමූහය'ට එක් වීමට දරන උත්සාහය නුදුරේදීම මල්ඵල ගනු ඇත. ඒ සඳහා සමාගම අභ්‍යන්තර (Organic) හා බාහිර (Inorganic) වර්ධන ක්‍රමෝපායයන් රාශියක්ම ක්‍රියාවට නැංවීමට අරමුණු කොට ගෙන සිටී. ජීවිත රක්ෂණ අංශයේ ලාභදායිතාව වැඩි කිරීම සඳහා මිලකරණය හා සංචිත ප්‍රතිපත්ති සමාලෝචනයට භාජනය වෙමින් පවතී. ජීව දත්ත ගණනය කිරීම් සඳහා නව පරිගණක පද්ධතියකට (New Actuarial System) හා දළ වාරික මත පදනම් වූ තක්සේරු කිරීම් (GPV) ක්‍රමවේදයකට සංක්‍රමණය වීම සමඟ අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධන කාර්යයසැලැස්මට (RBC) අනුගත වීමෙන් ලාභදායිතාව වැඩිදියුණු කර ගැනීමට හැකි වනු ඇත.

සාමාන්‍ය රක්ෂණ වෙළෙඳපොළේ තම තත්ත්වය වැඩිදියුණුකර ගැනීම සඳහා නව සමාගම ද ඒ හා සමාන වර්ධන ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කරනු ඇත. විභේදනයට ලක් වූ සමහර සමාගම් වලට සාමාන්‍ය රක්ෂණ කටයුතු වෙළෙඳපොළේ තරඟ කිරීම දුෂ්කර කාරණයක් වී ඇතත්, මෙම වෙළෙඳපොළේ ආයතන ඒකාබද්ධ වීම සඳහා අපමණ අවස්ථා පවත්නා බව අපගේ විශ්වාසයයි. පාර්ශ්වකරුවන් සඳහා අගය එකතු කළ හැකි ඒකාබද්ධවීම් හා අත්පත් කර ගැනීම් සඳහා පවත්නා අවස්ථා සොයා බැලීම කෙරෙහි සමාගම නිරතුරුව යොමු වී සිටී. ඊට අමතරව HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගමෙහි කොටස් යම් ප්‍රමාණයක් අදාළ රෙගුලාසි වලට අනුකූලව නුදුරේදී ම කොටස් හුවමාරුව වෙත මුදා හැරීමෙන් එම සමාගම ලැයිස්තුගත කිරීමට අදහස් කෙරේ. ඒ අතරතුර නව සමාගමට ක්‍රමෝපායික ආයෝජකයෙකු මාර්ගයෙන් තාක්ෂණික විශේෂඥතාව හා ගෝලීය විශිෂ්ටයන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙත් ලබා ගැනීම කෙරෙහි සමාගම සොයා බලමින් සිටී.

පොදු සේවා (Shared Services) සැපයීම් සඳහා වූ අංශය විසින් ජීවිත හා සාමාන්‍ය යන රක්ෂණ කාණ්ඩ දෙක සඳහාම උසස් මට්ටමේ කළමනාකරණ යෙදවුම් සැපයීමට කටයුතු කරනු ඇත. මෙකී පොදු සේවා සඳහා මූල්‍ය, තොරතුරු තාක්ෂණ, අලෙවිකරණ, මානව සම්පත්, ජීව ගණන, නීති හා අනුකූලතා යන අංශ ඇතුළත් වෙයි. එසේ වුවද දෛනික කාර්යයන් හා බැඳී පවත්නා කාරණා, ඒ ඒ ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන් යටතේ සංස්ථාපනය කොට ඇති සහායක සේවා (Support Services) ඒකක වලට දැනටමත් පවරා දී ඇත. නව ව්‍යුහය යටතේ ඔවුන්ගේ කාර්යයන් ගැටලුවකින් තොරව ක්‍රියාත්මක වීම පිළිබඳ 2015 දී විශේෂ අවධානයක් යොමු කරනු ඇත.

සමාගම එහි නව ව්‍යුහය යටතේ පැන නැගිය හැකි ඕනෑම අභියෝගයකට මුහුණ දීමටත්, බලයට පත් වී සිටින නව රජයේ වැඩ පිළිවෙල තුලින් උදා විය හැකි නව අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමටත් මුළුමනින්ම සූදානම්ව සිටින බව මාගේ විශ්වාසයි.

මංජුල ද සිල්වා

කළමනාකාර අධ්‍යක්ෂක

2015 පෙබරවාරි 9

# HNB ඇෂුවරන්ස් PLC
# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට, | සමූහය 2014 රු. '000 | සමාගම 2014 රු. '000 | සමාගම 2013 රු. '000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 133,942 | 133,942 | 137,009 |
| අස්පෘශ්‍ය වත්කම් | 51,622 | 51,622 | 53,807 |
| විලම්භීත බදු වත්කම් | - | - | 2 |
| මූල්‍ය ආයෝජන | 8,277,895 | 8,171,269 | 6,656,438 |
| ආයෝජන - පාලිත සමාගම | - | 100,000 | - |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය | 71,082 | 71,082 | 53,656 |
| ලැබිය යුතු ප්‍රති රක්ෂණ | 162,260 | 162,260 | 105,390 |
| ලැබිය යුතු රක්ෂණ වාරික | 364,051 | 364,051 | 301,182 |
| වෙනත් වත්කම් | 683,149 | 682,639 | 575,180 |
| රක්ෂණ ගිවිසුම් – විලම්භීත වියදම් | 52,072 | 52,072 | 32,912 |
| මුදල් සහ මුදල් සමානතා | 173,245 | 171,217 | 144,087 |
| **මුළු වත්කම්** | **9,969,318** | **9,960,154** | **8,059,663** |
| | | | |
| **හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | | | |
| **මව් සමාගමේ මුළු හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 1,171,875 | 1,171,875 | 1,171,875 |
| රඳවාගත් ඉපයීම් | 1,196,546 | 1,189,039 | 941,820 |
| අලෙවිය සඳහා පවතින සංචිත | 3,590 | 3,523 | 1,427 |
| වෙනත් සංචිත | 1,177 | 1,177 | 2,172 |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | 40,748 | 40,748 | (4,182) |
| මව් සමාගමේ මුළු හිමිකරු ප්‍රාග්ධනය | 2,413,936 | 2,406,362 | 2,113,112 |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය** | 2,413,936 | 2,406,362 | 2,113,112 |
| | | | |
| **වගකීම්** | | | |
| රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත රක්ෂණ | 5,562,648 | 5,562,648 | 4,348,490 |
| රක්ෂණ ප්‍රතිපාදන - සාමාන්‍ය රක්ෂණ | 1,279,138 | 1,279,138 | 1,011,102 |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | 71,493 | 71,493 | 56,637 |
| වර්තමාන බදු වගකීම | 12,012 | 10,422 | 35,143 |
| විලම්භීත බදු වගකීම | 8,845 | 8,845 | - |
| ගෙවිය යුතු ප්‍රති රක්ෂණ | 110,778 | 110,778 | 100,881 |
| වෙනත් වගකීම් | 510,468 | 510,468 | 394,298 |
| **මුළු වගකීම්** | 7,555,382 | 7,553,792 | 5,946,551 |
| | | | |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | **9,969,318** | **9,960,154** | **8,059,663** |

ඉහත මූල්‍ය තත්ව ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 272 හී ඇති විගණනය කරන ලද මූල්‍ය තත්ව ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC
## විස්තීරණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා, | සමූහය 2014 | සමාගම 2014 | සමාගම 2013 | වෙනස % සමාගම | වෙනස % සමූහය * |
|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | | |
| දළ ලේඛනගත රක්ෂණ වාරික | 4,665,618 | 4,665,618 | 3,877,730 | 20 | 20 |
| ප්‍රති රක්ෂකයන්ට කැපකළ වාරික | (601,022) | (601,022) | (526,005) | 14 | 14 |
| ශුද්ධ ලේඛනගත රක්ෂණ වාරික | 4,064,596 | 4,064,596 | 3,351,725 | 21 | 21 |
| නොඉපැයූ රක්ෂණ වාරිකවල සංචිතයේ ශුද්ධ වෙනස | (232,621) | (232,621) | (82,544) | 182 | 182 |
| **ඉපැයූ ශුද්ධ රක්ෂණ වාරික** | **3,831,975** | **3,831,975** | **3,269,181** | **17** | **17** |
| | | | | | |
| **වෙනත් ආදායම්** | | | | | |
| පොළී හා ලාභාංශ ආදායම | 824,015 | 816,876 | 785,177 | 4 | 5 |
| ශුද්ධ උපලබ්ධි ප්‍රතිලාභය | 108,823 | 105,785 | 53,411 | 98 | 104 |
| ශුද්ධ සාධාරණ අගය මත ලාභය | 99,281 | 99,281 | 13,099 | 658 | 658 |
| ගාස්තු සහ කොමිස් ආදායම් | 136,960 | 136,960 | 72,900 | 88 | 88 |
| වෙනත් ආදායම් | 12,366 | 12,366 | 12,830 | (4) | (4) |
| | **1,181,445** | **1,171,268** | **937,417** | **25** | **26** |
| | | | | | |
| **ශුද්ධ ආදායම** | **5,013,420** | **5,003,243** | **4,206,598** | **19** | **19** |
| **ශුද්ධ ප්‍රතිලාභ, වන්දි සහ වියදම්** | | | | | |
| ශුද්ධ රක්ෂණ ප්‍රතිලාභ සහ ගෙවූ වන්දි | (1,528,233) | (1,528,233) | (1,558,659) | (2) | (2) |
| ශුද්ධ ගෙවියයුතු රක්ෂණ වන්දිවල වෙනස | (44,871) | (44,871) | (9,549) | 370 | 370 |
| ජීවිත රක්ෂණ සංචිතයේ ගිවිසුම්ගත වගකීම්හී වෙනස | (1,192,273) | (1,192,273) | (724,829) | 64 | 64 |
| වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් | (1,303,710) | (1,303,130) | (1,084,148) | 20 | 20 |
| ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත්කරගැනීමේ වියදම් | (474,826) | (474,826) | (381,259) | 25 | 25 |
| වෙනත් රක්ෂණ අදාළ වියදම් | (30,924) | (30,924) | (23,061) | 34 | 34 |
| මුළු ප්‍රතිලාභ, වන්දි සහ වියදම් | (4,574,837) | (4,574,257) | (3,781,505) | 21 | 21 |
| | | | | | |
| **බදු පෙර ලාභය** | 438,583 | 428,986 | 425,093 | 1 | 3 |
| ආදායම් බදු වියදම | (20,857) | (19,267) | (35,970) | (46) | (42) |
| **වර්ෂය සඳහා වූ ලාභය** | **417,726** | **409,719** | **389,123** | **5** | **7** |
| | | | | | |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | 116,815 | 113,710 | 38,065 | 199 | 207 |
| - ආදායම් ප්‍රකාශයට මාරු කරන ලද නිශ්කාෂණය වූ ලාභය | (69,722) | (66,684) | (45,838) | 45 | 52 |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | (44,930) | (44,930) | 2,991 | (1,602) | (1,602) |
| ප්‍රතිමිනුම් මත ලාභ/අලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | (995) | (995) | 2,172 | (146) | (146) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම (බදු පසු)** | 1,168 | 1,101 | (2,610) | (142) | (145) |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | 418,894 | 410,820 | 386,513 | 6 | 8 |
| | | | | | |
| **බෙදාහැරීම් මුළු ලාභය :** | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු ලාභය | 417,726 | - | 389,123 | | 7 |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | | - |
| **වර්ෂයේ මුළු ලාභය** | 417,726 | - | 389,123 | | 7 |
| | | | | | |
| **බෙදාහැරීම් මුළු විස්තීරණ ආදායම :** | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු විස්තීරණ ආදායම | 418,894 | - | 386,513 | | 8 |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | | - |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | 418,894 | - | 386,513 | | 8 |
| | | | | | |
| **කොටසක ඉපයීම** | | | | | |
| කොටසක ඉපයීම - මූලික (රු.) | 8.35 | 8.19 | 7.78 | | 7 |
| කොටසක ලාභාංශය (රු.) | - | 3.75 | 3.25 | | 15 |

* ලකුණින් දක්වා ඇත්තේ 2014 **HNB** ඇෂුවරන්ස් සමූහයේ ප්‍රථිඵල සහ 2013 **HNB** ඇෂුවරන්ස් සමාගමේ හි ප්‍රථිඵල අතර සංසන්දනාත්මක වෙනසවේ.

ඉහත විස්තීරණ ආදායම් ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 273 හී ඇති විගණනය කරන ලද විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමූහය

| 2014 දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා, | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | අලෙවිය සඳහා පවතින සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | මුළු ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 1,171,875 | 941,820 | 1,427 | 2,172 | (4,182) | 2,113,112 |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| - වර්ෂය සඳහා වු ලාභය | - | 417,726 | - | - | - | 417,726 |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 47,093 | - | - | 47,093 |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (44,930) | - | - | (44,930) |
| - ප්‍රතිමිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | (995) | - | (995) |
| වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම | - | - | 2,163 | (995) | - | 1,168 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | - | 417,726 | 2,163 | (995) | - | 418,894 |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 44,930 | 44,930 |
| **හිමිකරුවන් සමඟ සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | |
| **- ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | |
| - 2013 වර්ෂය සඳහා වු ලාභාංශ | - | (162,500) | - | - | - | (162,500) |
| - පාලිත සමාගමේ කොටස් නිකුතුවට අදාළ ගණුදෙනු සඳහා වියදම | - | (500) | - | - | - | (500) |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | - | (163,000) | - | - | - | (163,000) |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,171,875** | **1,196,546** | **3,590** | **1,177** | **40,748** | 2,413,936 |

ඉහත හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 274 හී ඇති විගණනය කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමාගම

| 2014 දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා, | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | අලෙවිය සඳහා පවතින සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්‍ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | මුළු ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 1,171,875 | 690,197 | 6,209 | - | (1,191) | 1,867,090 |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| වර්ෂය සඳහා වු ලාභය | - | 389,123 | - | - | - | 389,123 |
| | | | | | | |
| **වර්ෂය සඳහා වු වෙනත් විස්තීරණ ආදායම්** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මුල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (7,773) | - | - | (7,773) |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 2,991 | - | - | 2,991 |
| - ප්‍රතිමිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | 2,172 | - | 2,172 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | (4,782) | 2,172 | - | (2,610) |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 389,123 | (4,782) | 2,172 | - | 386,513 |
| | | | | | | |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිත අරමුදලට පවරන ලද විකිණීම සඳහා | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (2,991) | (2,991) |
| හිමිකරුවන් සමඟ සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම් | | | | | | |
| 2012 වර්ෂය සඳහා වු ලාභාංශ | - | (137,500) | - | - | - | (137,500) |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | | (137,500) | | | | (137,500) |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 941,820 | 1,427 | 2,172 | (4,182) | 2,113,112 |
| | | | | | | |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 1,171,875 | 941,820 | 1,427 | 2,172 | (4,182) | 2,113,112 |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| වර්ෂය සඳහා වු ලාභය | - | 409,719 | - | - | - | 409,719 |
| | | | | | | |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මුල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 47,026 | - | - | 47,026 |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (44,930) | - | - | (44,930) |
| - ප්‍රතිමිනුම් මත ලාභ/අලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | (995) | - | (995) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | 2,096 | (995) | - | 1,101 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 409,719 | 2,096 | (995) | - | 410,820 |
| | | | | | | |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිත අරමුදලට පවරන ලද විකිණීම සඳහා | | | | | | |
| වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 44,930 | 44,930 |
| **හිමිකරුවන් සමඟ සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | |
| 2013 වර්ෂය සඳහා වු ලාභාංශ | - | (162,500) | - | - | - | (162,500) |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | - | (162,500) | - | - | - | (162,500) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 1,189,039 | 3,523 | 1,177 | 40,748 | 2,406,362 |

ඉහත හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 275 හී ඇති විගණනය කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා, | | සමූහය<br>2014<br>රු. '000 | සමාගම<br>2014<br>රු. '000 | සමාගම<br>2013<br>රු. '000 |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | |
| බදු පෙර ලාභය | | 438,583 | 428,986 | 425,093 |
| <u>ගැලපීම්:</u> | | | | |
| පොළී ආදායම | | (808,970) | (801,831) | (766,566) |
| ලාභාංශ ආදායම | | (15,045) | (15,045) | (18,611) |
| අස්පෘෂ්‍ය වත්කම් ක්ෂය කිරීම් | | 17,975 | 17,975 | 16,029 |
| දේපල පිරියත හා උපකරණ ක්ෂය කිරීම් | | 40,330 | 40,330 | 36,808 |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් | | 19,050 | 19,050 | 18,739 |
| ශුද්ධ සාධාරණ අගය මත ලාභ | | (99,281) | (99,281) | (13,099) |
| විකිණීම සඳහා වර්ගීකරණය කල සුරැකුම්හි ශුද්ධ ලාභ | | (108,823) | (105,785) | (53,411) |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් ලාභය/(අලාභය) | | 174 | 174 | (3,188) |
| | | (516,007) | (515,427) | (358,206) |
| මෙහෙයුම් වත්කම් වල වෙනස | (අ) | (299,620) | (299,110) | (164,559) |
| මෙහෙයුම් වගකීම් වල වෙනස | (ආ) | 1,608,263 | 1,608,263 | 761,451 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ | | 792,636 | 793,726 | 238,686 |
| ගෙවු පාරිතෝෂිකය | | (5,189) | (5,189) | (2,290) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වු ශුද්ධ මුදල් ප්‍රවාහ | | 787,447 | 788,537 | 236,396 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | |
| ආයෝජන සුරැකුම් ශුද්ධ මිලදී ගැනුම් | | (1,148,749) | (1,047,491) | (1,048,380) |
| ලද පොළී | | 591,459 | 586,583 | 921,111 |
| ලද ලාභාංශ | | 15,228 | 15,228 | 18,168 |
| ආයෝජන පාලිත සමාගම | | - | (100,000) | - |
| අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනුම් | | (15,790) | (15,790) | (5,092) |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනුම් | | (37,747) | (37,747) | (54,238) |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් සඳහා ලද මුදල් | | 310 | 310 | 4,329 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදා ගත් ශුද්ධ මුදල් ප්‍රවාහ | | (595,289) | (598,907) | (164,102) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | |
| ලාභාංශ ගෙවීම් | | (162,500) | (162,500) | (137,500) |
| කොටස් නිකුතුව හා සම්බන්ධ වියදම් - පාලිත සමාගම | | (500) | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදා ගත් ශුද්ධ මුදල් ප්‍රවාහ | | (163,000) | (162,500) | (137,500) |
| **මුදල් සහ මුදල් වලට සමාන වත්කම් වල ශුද්ධ වැඩි වීම** | (ඇ) | 29,158 | 27,130 | (65,206) |
| වසර මුල මුදල් සහ මුදල් වලට සමාන වත්කම් | | 144,087 | 144,087 | 209,293 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් වලට සමාන වත්කම්** | | 173,245 | 171,217 | 144,087 |

<u>මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ සටහන්</u>

| | සමූහය<br>2014 | සමාගම<br>2014 | සමාගම<br>2013 |
|---|---|---|---|
| **(අ) මෙහෙයුම් වත්කම් වල වෙනස** | | | |
| විලම්භිත වියදම් වල වැඩි වීම් | (19,160) | (19,160) | (12,944) |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය වල වැඩි වීම් | (17,426) | (17,426) | (23,768) |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වල වැඩි වීම් | (56,870) | (56,870) | 57,325 |
| ලැබිය යුතු රක්ෂණ වාරිකයන්හී වැඩි වීම් | (62,869) | (62,869) | (53,765) |
| මුළු වෙනත් වත්කම් වල වැඩි වීම් | (143,295) | (142,785) | (131,407) |
| | (299,620) | (299,110) | (164,559) |
| **(ආ) මෙහෙයුම් වගකීම් වල වෙනස** | | | |
| මුළු වගකීම් වල වැඩි වීම්/(අඩු වීම්) | 116,172 | 116,172 | (20,087) |
| රක්ෂණ ප්‍රතිපාදන – සාමාන්‍ය රක්ෂණ වල වැඩි වීම් | 268,036 | 268,036 | 41,659 |
| රක්ෂණ ප්‍රතිපාදන – ජීවිත රක්ෂණ වල වැඩි වීම් | 1,214,158 | 1,214,158 | 722,251 |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ – වැඩි වීම් | 9,897 | 9,897 | 17,628 |
| | 1,608,263 | 1,608,263 | 761,451 |
| **(ඇ) මුදල් සහ මුදල් වලට සමාන වත්කම් වල වැඩි වීම්/(අඩු වීම්)** | | | |
| වසර අවසානයේ මුදල් සහ මුදල් වලට සමාන වත්කම් - ශුද්ධ අගය | 173,245 | 171,217 | 144,087 |
| අඩුකලා : වසර මුල මුදල් සහ මුදල් වලට සමාන වත්කම් - ශුද්ධ අගය | 144,087 | 144,087 | 209,293 |
| මුදල් සහ මුදල් වලට සමාන වත්කම් වල ශුද්ධ වැඩි වීම්/(අඩු වීම්) | 29,158 | 27,130 | (65,206) |

ඉහත මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 276 හී ඇති විගණනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.